සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :-- .................................................................................. කාලය : පැය 02 යි.

### I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න අංක 01 සිට අංක 10 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය තුළ ඉහළම අධිකරණය ලෙස කටයුතු කරනු ලබන්නේ,

(1) මහාධිකරණයයි. (2) ශ්‍රේෂ්ඨාධිකරණයයි.
(3) දිසා අධිකරණය යි. (4) අභියාචනාධිකරණය යි.

(2) ප්‍රාදේශීය සභාවක ප්‍රධානියා ලෙස කටයුතු කරනු ලබන්නේ,

(1) ලේකම්වරයා ය. (2) නගරාධිපතිවරයා ය.
(3) සභාපතිවරයා ය. (4) කොමසාරිස්වරයා ය.

(3) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ග්‍රීසියේ ඇතන්ස් පෞර රාජ්‍යවල ප්‍රධාන පාලන ආයතනය ලෙස ක්‍රියාත්මක වූයේ කුමක් ද?

(1) පළාත් සභාව (2) ප්‍රාදේශීය සභාව
(3) නගර සභාව (4) පුරවැසි සභාව

(4) සමූපකාර ව්‍යාපාරය යටතේ ශ්‍රී ලංකාවේ පිහිට වූ ප්‍රථම සමූපාකාර සමිතිය වන්නේ,

(1) තෙල්දෙණිය සමූපාකාර ණය දෙන සමිතිය (2) දුම්බර ජෛව සම්පත් සමූපාකාර සමිතිය
(3) තෙල්දෙණිය විවිධ සේවා සමූපාකාර සමිතිය (4) දුම්බර සමූපාකාර ණය දෙන සමිතිය

(5) ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා පොදුවේ ''සමාජ සුරක්ෂිතතාව'' ඇති කිරීම සඳහා ඉටු කරනු ලබන කාර්යයක් වන්නේ,

(1) හදිසි ආපදා හා විපත් අවස්ථාවල දී සහන සේවා සැපයීම.
(2) ගොඩබිමින් හෝ ජලයෙන් ලඟ විය නොහැකි තැන්වලට ළඟා වී සහන සේවා සැපයීම
(3) ජල විපත් වලින් විපතට පත් වූවන් බේරා ගැනීම.
(4) ශ්‍රී ලංකාවේ දූපත් අතර ප්‍රවාහන පහසුකම් සැපයීම.

(6) ශ්‍රී ලංකාවට ආවේනික වූ දේශීය ශාක වර්ග පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය කුමක් ද?

(1) ඇටඹ, කැකුණ, වල්දෙල්, කොස් (2) බදුල්ල, මහරත්මල්, මුරුත, වල්දෙල්
(3) ඇටඹ, කැකුණ, වල් දෙල්, මහරත් මල් (4) කොස්, බුරුත, නැදුන්, ඇටඹ

(7) වර්තමානයේ අධ්‍යාපනය සඳහා නවීන තාක්ෂණය භාවිත කිරීමේ දී සිදු කළ නවත ම හඳුන්වා දීම වන්නේ මින් කුමක් ද?

(1) වයිබර් (Viber) (2) ඉන්ටර්නෙට් (Internet)
(3) සැටලයිට් (Satellite) (4) ඊ - ලර්නින් (e - Learning)

(8) බැංකු කටයුතුවල දී කාඩ්පත් මගින් මුදල් ගනුදෙනු කිරීම සඳහා වර්තමානයේ හඳුන්වා දී ඇති උපකරණය වන්නේ,

(1) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයයි. (2) ස්කෑන් යන්ත්‍රය යි.

(3) ඊ - බැන්කින් ක්‍රමයයි. (4) ස්කෑනර් යන්ත්‍ර යි.

(9) ''ළමුන් සඳහා හිතකාමී හා සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම'' අරමුණු කර ගත් ජාතික ළමා ආරක්ෂක අධිකරියේ සෘජු දුරකථන අංකය වන්නේ මින් කුමක් ද?

(1) 1929 (2) 1959

(3) 1969 (4) 1991

(10) තමා විසින් ම සකස් කරගත් ඇඳුම් අඳිමින් දේශීය නිෂ්පාදන වල අගය ජනතාවට පෙන්වා දුන් ශ්‍රේෂ්ඨ ඉන්දියානු නායකයා වූයේ,

(1) ශ්‍රී ජවහල්ලාල් නේරු ය. (2) මහත්මා ගාන්ධි ය.

(3) දඩබායි නවරෝජි ය. (4) සුරේන්ද්‍රනාත් බැනර්ජි ය.

**අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල සඳහන් ප්‍රකාශ නිවැරදි (3) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් යොදන්න.**

(11) රටක, සමාජ, ආර්ථික සංස්කෘතික හා පාරිසරික රටා වලට ගැළපෙන පරිදි තාක්ෂණය යොදා ගැනීම යෝග්‍ය තාක්ෂණය ලෙස හැඳින්වේ. ( )

(12) ජනතාව අතර ඇති වන සුළු ආරවුල් අධිකරණය වෙත නොගොස් නිරාකරණය කරනුයේ ග්‍රාමෝදය මණ්ඩල මගිනි. ( )

(13) ශ්‍රී ලංකාවේ නූතන පළාත් පාලන ආයතනවල ආරම්භය සිදු වූයේ බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ය. ( )

(14) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයේ දී මැතිවරණ මගින් පාලනය සඳහා සහභාගී වීමට ජනතාවට අවස්ථාව ලැබේ. ( )

(15) මහනගර සභාවක නාගරික කොමසාරිස්වරයා පත් කරනු ලබන්නේ ජනාධිපති විසිනි. ( )

**අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා, දී ඇති හිස්තැන මත ලියන්න.**

(16) සමාජයේ පවත්නා සියලු ම රැකියා අවස්ථා ........................................... ලෙස හැඳින් වේ.

(17) එකිනෙකාට උදවු කරමින් සහයෝගයෙන් කටයුතු කිරීම ........................................... ලෙස හැඳින්වේ.

(18) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක වැදගත් කරුණු සම්බන්ධයෙන් මහජන මතය විමසීම සඳහා ........................................... පවත්වනු ලැබේ.

(19) රටක සමාජ සුරක්ෂිතතාව නිසි පරිදි තහවුරු වීම තුළින් ........................................... ඇති කර ගත හැකි වේ.

(20) පාසල් සමුපකාර සමිති සාර්ථකව ක්‍රියාත්මක වන දකුණු ආසියාතික රටක් වන්නේ ........................................... යි.

(බංගලාදේශය, අන්‍යෝන්‍ය රැඳියාව, වැඩ ලෝකය, ජනමත විචාරණ, මැලේසියාව, රැකියා වෙළඳපොළ, තිරසාර සාමය, මැතිවරණ)

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

- පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ඉතිරි ප්‍රශ්නවලින් හතරක් තෝරා ගන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(1) (i) ලෝකයේ ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් දෙකක් නම් කරන්න.

(ii) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කර ඇති විද්වතුන් දෙදෙනෙක් නම් කරන්න.

(iii) මැතිවරණවලදී නියෝජිතයන් තෝරා ගැනීම සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්ප ක්‍රම දෙක සඳහන් කරන්න.

(iv) ක්‍රියාත්මක වන ආකාරය අනුව නීතිය බෙදිය හැකි වර්ග දෙක දක්වන්න.

(v) වර්තමාන රැකියා වෙළඳපොළ බෙදා දැක්විය හැකි ප්‍රධාන අංශ දෙක නම් කරන්න.

(vi) ජපානයට ආවේනික වූ සංස්කෘතිකාංග දෙකක් සඳහන් කරන්න.

(vii) ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන්ම ආරම්භ කළ මහ නගර සභා දෙකක් ලියා දක්වන්න.

(viii) රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණය හා වෙනත් ආයතනවලට විශේෂඥ උපදෙස් සපයනු ලබන්නේ කුමන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ද? (ලකුණු 2 x 8 = 16)

(2) ''ශ්‍රී ලංකාව තුළ සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා විවිධ මූලාශ්‍ර පදනම් කරගෙන නීති සකස් කර තිබේ.''

(i) නීතියේ මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) ශ්‍රී ලංකාව තුළ අපරාධ නීතිය ක්‍රියාත්මක කරනු ලබන අවස්ථා හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)

(iii) සමාජ සුරක්ෂිතතාව ඉටු කිරීම සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කරන ආයතන හතරක් නම් කරන්න. (ලකුණු 4)

(3) (i) ඕනෑම රටක ආර්ථිකයක් තුළ ප්‍රධාන ක්‍රියාවලි තුනක් සිදු වේ. ඒවා මොනවා ද? (ලකුණු 3)

(ii) වර්තමාන රැකියා වෙළඳපොළෙහි විවිධ රැකියා සඳහා පවතින ඉල්ලුම වෙනස් වීම කෙරෙහි බලපා ඇති කරුණු හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)

(iii) වර්තමාන රැකියා වෙළඳ පොළෙහි පවතින තරගකාරීත්වයට මුහුණ දීම සඳහා ශ්‍රමිකයන් අවධානය යොමු කළ යුතු කරුණු හතරක් දක්වන්න. (ලකුණු 4)

(4) (i) පහත සඳහන් ශ්‍රී ලාංකීය ජන කොටස්වලට සම්බන්ධ ආගමික උත්සව එක බැගින් ලියා දක්වන්න.

A - සිංහල

B - දෙමළ

C - මුස්ලිම් (ලකුණු 3)

(ii) රටවල් අතර අන්‍යෝන්‍ය රැඳියාවෙන් යුතුව කටයුතු කිරීම සඳහා විවිධ රටවල් එක් වී පිහිටුවා ගෙන ඇති සංවිධාන හතරක් නම් කරන්න. (ලකුණු 4)

(iii) සහජීවනය ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වීමට බලපා ඇති සාධක හතරක් දක්වන්න. (ලකුණු 4)

(5) ''ජනතාවගේ බහුතර කැමැත්ත මත ඔවුන් විසින් ගොඩනගා ගන්නා පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ලෙස හැඳින්වේ.''

(i) ලෝකයේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) වර්තමාන සමාජය තුළ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේ දී මතු වන ගැටලු හතරක් නම් කරන්න. (ලකුණු 4)

(iii) ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි බලපාන සාධක හතරක් නම් කරන්න. (ලකුණු 4)

(6) ''යම් ප්‍රතිපත්ති මාලාවක් පදනම් කරගෙන ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා සංවිධානය වූ පුද්ගල කණ්ඩායමක් දේශපාලන පක්ෂයක් යනුවෙන් හැඳින්වේ.''

(i) ක්‍රියාත්මක වන ආකාරය අනුව දේශපාලන පක්ෂ බෙදිය හැකි ප්‍රධාන වර්ග තුන මොනවා ද? (ලකුණු 3)

(ii) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන මැතිවරණ ක්‍රම හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)

(iii) ශ්‍රී ලාංකිකයෙකු විසින් ඡන්ද බලය ලබා ගැනීම සඳහා සපුරා ගත යුතු සුදුසුකම් හතරක් නම් කරන්න.

(ලකුණු 4)

(7) ''රටක ජීවත් වන ජනතාවට අවශ්‍ය ප්‍රජා සේවා පහසුවෙන් හා කාර්යක්ෂම ව පවත්වාගෙන යාම සඳහා පළාත් පාලන ආයතන උපකාරී වේ.''

(i) නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතන තුනක් ලියා දක්වන්න. (ලකුණු 3)

(ii) පළාත් පාලන ආයතනයක ප්‍රධානියා සතු බලතල හතරක් නම් කරන්න. (ලකුණු 4)

(iii) පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන නිර්ණායක හතරක් දක්වන්න. (ලකුණු 4)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

---

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (6) | 3 | (11) | 3 | (16) | වැඩ ලෝකය |
| (2) | 3 | (7) | 4 | (12) | x | (17) | අන්‍යෝන්‍ය රැඳියාව |
| (3) | 4 | (8) | 1 | (13) | 3 | (18) | ජනමත විචාරණය |
| (4) | 4 | (9) | 1 | (14) | 3 | (19) | තිරසාර සාමය |
| (5) | 1 | (10) | 2 | (15) | x | (20) | මැලේසියාව |

## II කොටස

(1) (i) උතුරු කොරියාව, කියුබාව

(ii) ඒබ්‍රහම් ලින්කන්, සීලර්

(iii) සරල බහුතර නියෝජන ක්‍රමය, සමානුපාතික නියෝජන ක්‍රමය

(iv) දේශීය නීතිය, අන්තර් ජාතික නීතිය

(v) දේශීය රැකියා වෙළඳපොළ, විදේශීය රැකියා වෙළඳපොළ

(vi) හිස නමා ආචාර කිරීම, කිමෝනාව ඇඳීම, සූමෝ ක්‍රීඩාව, මලවුන් ඇදහීම

(vii) කොළඹ මහ නගර සභාව, ගාල්ල මහ නගර සභාව, මහනුවර මහ නගර සභාව

(viii) අධිකරණ විද්‍යාව, ආහාර විද්‍යාව

(iii) L අධිකරණය
L පොලිස් දෙපාර්තමේන්තුව
L සෞඛ්‍යය දෙපාර්තමේන්තුව
L ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
L මධ්‍යම පරිසර අධිකාරිය
L කම්කරු විනිශ්චය සභාව
L අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව
L රේගු දෙපාර්තමේන්තුව
L සුරාබදු දෙපාර්තමේන්තුව
L ශ්‍රී ලංකා තේ මණ්ඩලය

(2) (i) ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව, අධිකරණ තීරණ, ව්‍යවස්ථා අණ පනත්, නීති විශාරදයන්ගේ මත, සිරිත් - විරිත්, ආගම

(ii) L මිනී මැරීම හා මිනී මැරීමට තැත් කිරීම
L මංකොල්ල කෑම
L ස්ත්‍රී දූෂණ
L ළමා අපයෝජන
L පැහැර ගැනීම්
L අතුරුදහන් කිරීම්
L මත්ද්‍රව්‍ය භාවිතය හා වෙළඳාම
L සොරකම

(3) (i) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය

(ii) L මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම.
L අධ්‍යාපනය ලබන පිරිස් ක්‍රමිකව වැඩි වීම.
L මිනිස් ශ්‍රමය වෙනුවට විවිධ යන්ත්‍ර සූත්‍ර භාවිතයට පැමිණීම.
L ජනගහනය වර්ධනය සමඟ ශ්‍රම බලකාය වර්ධනය වීම.

(iii) L නව තාක්ෂණික උපකරණ පිළිබඳ පුහුණුව
L පරිගණක භාවිතය පිළිබඳ දැනුම
L අතිරේක කාලයක් සේවය සැපයීමට කැපවීම.
L නම්‍යශීලීතාවය
L විවිධ භාෂා හැකියා වර්ධනය කර ගැනීම.

(4) (i) A - වෙසක්, පොසොන් ඇසළ

B - මහා ශිව රාත්‍රි, තෛපොංගල්

C - හජ්ජි, රාමසාන්

(ii) එක්සත් ජා. සං, සාර්ක් සං, යුරෝපා ආර්ථික හවුල, ආසියාන් සං.

(iii) L සම්පත් විසංතුලනය

L ගෝලීය විවිධත්වය

L තම රටට අවශ්‍ය සියලු දෑ රට තුළ ම නිපදවා ගැනීමට නොහැකි වීම.

L තොරතුරු තාක්ෂණය සීඝ්‍රයෙන් දියුණු වීම.

L සමස්ථ ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වීම.

(5)(i) ශ්‍රී ලංකාව, ඉන්දියාව, එක්සත් රාජධානිය, ඇ.එ.ජ., කැනඩාව, ප්‍රංශය, ස්විස්ටර්ලන්තය

(ii) L ජනගහනය අධික වීම.

L එක් ස්ථානයකට රැස්වීම අපහසු වීම.

L මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම.

L වර්තමාන පාලන කටයුතු- සංකීර්ණ වීම.

(iii) L ජනතාවගේ දේශපාලන දැනුම හා අවබෝධය ඉහළ මට්ටමක පැවතීම.

L පාලකයන් තෝරා ගැනීමේ දී ජනතාව බුද්ධිමත්ව කටයුතු කිරීම.

L අවංක උදාර නායකත්වයක් පැවතීම.

L රට තුළ යහපත් ආර්ථික මට්ටමක් පැවතීම.

L ජනමාධ්‍ය නිදහස ක්‍රියාත්මක වීම.

L රට තුළ නීතියේ ආධිපත්‍යය පැවතීම.

L ආණ්ඩුවේ කාර්යය බෙදා වෙන් කර තිබීම.

L ප්‍රබල විරුද්ධ පක්ෂයක් පැවතීම

(6)(i) ඒක පක්ෂ ක්‍රමය, ද්වි පක්ෂ ක්‍රමය, බහු පක්ෂ ක්‍රමය

(ii) L ජනාධිපතිවරණය

L මහා මැතිවරණය / පාර්ලිමේන්තු මැතිවරණය

L පළාත් සභා මැතිවරණය

L පළාත් පාලන මැතිවරණය

(iii) L ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.

L වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම.

L ඡන්ද හිමි නාමලේඛණයේ නම ඇතුළත් කර තිබීම.

L ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි කර නොතිබීම.

(7) (i) ගම් සභා, සුළු නගර සභා, නගර සභා, මහ නගර සභා

(ii) L සභාව කැඳවීම හා කල් තැබීම

L සභාවේ මුලසුන දැරීම.

L මහජන උපයෝගීතා සේවා සැපයීමට මුල් වීම

L පළාත් පාලන ආයතන සතු කටයුතු සංවිධානය කිරීම හා මෙහෙය වීම.

(iii) L ජන වාර්ගික අනුපාතය

L භූගෝලීය ප්‍රදේශය හා එහි භෞතික ලක්ෂණ

L ජනගහණය හා ජන ඝනත්වය

L ආර්ථික සංවර්ධන මට්ටම